# "සහසක් නිමැවුම් - 2020" ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනය සඳහා වන පළාත් මට්ටමේ පූර්ව දැනුවත් කිරීම හා නව නිපැයුම් තෝරාගැනීම

## <u>පළාත් නව නිපැයුම් තරඟයේ කොන්දේසි සහ තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ</u>

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් "සහසක් නිමැවුම් - 2020" ජාත්‍යන්තර නව නිපැයුම් ප්‍රදර්ශනය හා තරඟය සඳහා නව නිපැයුම්කරුවන් තෝරාගැනීම පළාත් මට්ටමින් සිදුකරනු ලබයි.

### <u>පළාත් මට්ටමේ පූර්ව දැනුවත් කිරීමේ හා නව නිපැයුම් තෝරාගැනීමේ කාලසටහන</u>

| පළාත | පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන | | මූලික තෝරාගැනීම | | අයදුම්පත් කොමිසම වෙත යොමු කළ යුතු අවසන් දිනය |
|---|---|---|---|---|---|
| | දිනය | ස්ථානය | දිනය | ස්ථානය | |
| සබරගමුව | 2020.01.14 | තාක්ෂණ විද්‍යාලය, රත්නපුර | 2020.03.02 | තාක්ෂණ විද්‍යාලය, රත්නපුර | 2020.02.17 |
| දකුණ - හම්බන්තොට | 2020.01.15 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්බලන්තොට (විදාතා සම්පත් මධ්‍යස්ථානය) | 2020.03.04 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්බලන්තොට (විදාතා සම්පත් මධ්‍යස්ථානය) | |
| දකුණ - මාතර | 2020.01.16 | තාක්ෂණ විද්‍යාලය, මාතර | 2020.03.05 | තාක්ෂණ විද්‍යාලය, මාතර | |
| දකුණ - ගාල්ල | 2020.01.17 | තාක්ෂණ විද්‍යාලය, ගාල්ල | 2020.03.06 | තාක්ෂණ විද්‍යාලය, ගාල්ල | |
| උතුරු මැද - පොළොන්නරුව | 2020.01.23 | රාජකීය විද්‍යාලය, පොළොන්නරුව | 2020.03.10 | තාක්ෂණ විද්‍යාලය, අනුරාධපුර | 2020.02.24 |
| උතුරු මැද - අනුරාධපුර | 2020.01.24 | තාක්ෂණ විද්‍යාලය, අනුරාධපුර | | | |
| වයඹ | 2020.01.22 | උසස් තාක්ෂණ ආයතනය, විල්ගොඩ පාර, කුරුණෑගල | 2020.03.13 | උසස් තාක්ෂණ ආයතනය, විල්ගොඩ පාර, කුරුණෑගල | |
| නැගෙනහිර | 2020.02.05 | ශාන්ත මයිකල් විද්‍යාලය, මඩකලපුව | 2020.03.16 | ශාන්ත මයිකල් විද්‍යාලය, මඩකලපුව | 2020.03.09 |
| උතුර | 2020.02.07 | තාක්ෂණ විද්‍යාලය, යාපනය | 2020.03.18 | තාක්ෂණ විද්‍යාලය, යාපනය | |
| ඌව | 2020.01.30 | තාක්ෂණ විද්‍යාලය, බදුල්ල | 2020.04.27 | තාක්ෂණ විද්‍යාලය, බදුල්ල | 2020.03.02 |
| මධ්‍යම | 2020.01.29 | ධර්මරාජ විද්‍යාලය, මහනුවර | 2020.04.24 | ධර්මරාජ විද්‍යාලය, මහනුවර | |
| බස්නාහිර - කළුතර | 2020.02.12 | තාක්ෂණ විද්‍යාලය, කළුතර | 2020.04.29 | තාක්ෂණ විද්‍යාලය, කළුතර | 2020.03.20 |
| බස්නාහිර - ගම්පහ | 2020.02.13 | බණ්ඩාරනායක විද්‍යාලය, ගම්පහ | 2020.04.30 | බණ්ඩාරනායක විද්‍යාලය, ගම්පහ | |
| බස්නාහිර - කොළඹ | 2020.02.14 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව, කොළඹ 10 - පුහුණු ආයතන ශ්‍රවණාගාරය | 2020.05.16<br>2020.05.17 | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, කොළඹ 08 | |

### <u>පළාත් තරඟය සඳහා ඉදිරිපත් විය හැකි අංශයන්</u>

පහත සඳහන් අංශයන්ගෙන් <u>එක් අංශයකින්</u> ඔබට තරඟය සඳහා ඉදිරිපත් විය හැකිය.

- පාසල් අංශය
- විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය
- වාණිජකරණය වූ නව නිපැයුම් අංශය
- විවෘත අංශය

## පාසල් අංශය

- පාසල් අංශය සඳහා වූ අයදුම්කරුවන්ගේ උපරිම වයස් සීමාව වනුයේ දෙවන වර අ.පො.ස. උසස් පෙළ සඳහා පෙනී සිටින සිසුන්ගේ වයස් සීමාව වේ. එම වයස් සීමාවෙහි වූ සිසුන්ට පාසල් අංශය හැර වෙනත් අංශයකින් ඉදිරිපත් විය නොහැකිය. ඔවුන් අයදුම්පත ඉදිරිපත් කරන වර්ෂය තුළ පාසලක අධ්‍යාපනය හදාරමින් සිටිය යුතු අතර පාසල් හැරගිය ශිෂ්‍යයන් නොවිය යුතුය. මෙම අයදුම්කරුවන් අයදුම්පත්‍රයේ 5 පිටුවේ සඳහන් තොරතුරු සම්පූර්ණ කර විදුහල්පති ගේ නිර්දේශය සමඟ එවීම අනිවාර්යය වේ.

- පාසල් සිසුන්ගේ කණ්ඩායම් නව නිපැයුම් සඳහා සහභාගී විය හැකි උපරිම සිසුන් ගණන 02කි.

- පාසල් සිසුන් කණ්ඩායම් නව නිපැයුම් ඉදිරිපත් කිරීමේදී කණ්ඩායමේ අනිත් සාමාජිකයා ද පාසල් සිසුවෙක් වීම අනිවාර්යය වේ. පාසල් සිසුන්ට වෙනත් අංශයන්ගෙන් ඉදිරිපත් වන නව නිර්මාණකරුවන්ගේ සාමාජිකයින් ලෙස ඉදිරිපත් විය නොහැකිය.

පාසල් සිසුන් ඉහත සඳහන් කර ඇති තම ශිෂ්‍ය භාවය නිසි පරිදි තහවුරු කිරීමට අපොහොසත්ව ඇති අවස්ථාවන්හි දී, ඔවුන්ගේ නව නිපැයුම් "විවෘත අංශයේ" නව නිපැයුම් සේ සළකා ඇගයීම් කටයුතු සිදුකරනු ලැබේ.

## විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය

- විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය සඳහා ඉදිරිපත් වන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් දැනට විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් පළමු උපාධිය සම්පූර්ණ කිරීමේ නියැළී සිටිය යුතුය. තෘතියික අධ්‍යාපන ආයතන නියෝජනය කරන ශිෂ්‍යයන් දැනට එම අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යාපන කටයුතු වල නියැළී සිටිය යුතුය.

- මෙම සිසුන් දෙපිරිසටම විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය හැර වෙනත් අංශයකින් ඉදිරිපත් විය නොහැකිය.

- මෙම අයදුම්කරුවන් ශිෂ්‍ය හැඳුනුම්පතේ ඡායාපිටපතක් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමඟ යොමුකළ යුතුය.

- නව නිපැයුම සඳහා සම්බන්ධ වූ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට කණ්ඩායම් සාමාජිකයන් ලෙස ඉදිරිපත් විය හැකිය.

විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතනයන් හි සිසුන් ඉහත දක්වා ඇති පරිදි තම ශිෂ්‍ය භාවය නිසි පරිදි තහවුරු කිරීමට අපොහොසත්ව ඇති අවස්ථාවන්හි දී, එම නව නිපැයුම් "විවෘත අංශයේ" නව නිපැයුම් සේ සළකා ඇගයීම් කටයුතු සිදුකරනු ලැබේ.

## වාණිජකරණය වූ නව නිපැයුම් අංශය

- වාණිජකරණය කරන ලද නව නිපැයුම් අංශයෙන් ඉදිරිපත් වන තරඟකරුවන් තම නව නිපැයුම වාණිජකරණය වී ඇති බවට සහ බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිත කරගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවට නිසි සාක්ෂි (උදා- නිකුත් කරන ලද පේටන්ට් බලපත්‍රය හෝ පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කළ විස්තර, නව්‍යතාවය, පාරිසරික බලපෑම, සුරක්ෂිතතාවය, ව්‍යාපාරයේ පැවැත්ම, අපනයන අවස්ථාවන් සහ දළ වාර්ෂික ආදායම ආදී තොරතුරු තහවුරු කිරීම සඳහා) විනිශ්චය මණ්ඩලයට අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

## විවෘත අංශය

- ඉහත අංශයන්ට අදාළ නොවන සියළුම නව නිපැයුම්කරුවන්ට විවෘත අංශයෙන් පළාත් තරඟය සඳහා ඉදිරිපත් විය හැකිය.

## අයදුම්පත් යොමු කිරීම සඳහා වන පොදු උපදෙස්

කොමිසම මඟින් නිර්වචනය කර ඇති පරිදි අයදුම්කරුවන් අදාළ අංශයන්ගෙන් හැර වෙනත් අංශයකින් අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු අතර නිවැරදි තරඟ අංශයට ඉදිරිපත් නොවූ අයදුම්පත් කොමිසම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඔබ විසින් ඉදිරිපත් කරන සෑම නව නිපැයුමකටම එක් අයදුම්පත බැගින් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. එක් අයදුම්පතක නව නිපැයුම් එකකට වැඩි ගණනක් පිළිබඳව සටහන් කිරීම ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

කණ්ඩායම් නව නිපැයුම් ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විස්තර කණ්ඩායමේ නායකත්වය ගනු ලබන පුද්ගලයාගේ විස්තර සේ සලකාබලනු ලබන අතර අනෙක් සාමාජිකයන්ගේ විස්තර අයදුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය. කණ්ඩායමේ සාමාජිකයන් පිළිබඳව **පසුව සිදුකරනු ලබන වෙනස්වීම් කොමිසම විසින් භාරගනු නොලැබේ.**

මීට ඉහත දී කොමිසම විසින් සංවිධානය කරනු ලැබූ සහසක් නිමැවුම් තරඟාවලීන් හි දී ජයග්‍රහණය කරන ලද නව නිපැයුම්, එම අංශයෙන්ම නැවත ඉදිරිපත් කරන්නේ නම් සාධනීය වැඩි දියුණු කිරීමකින් තොරව මෙම වර්ෂයේ පළාත් නව නිපැයුම් තරඟ සඳහා ඉදිරිපත් කළ නොහැක.

නව නිපැයුම තරඟ විනිශ්චයන් සඳහා භෞතිකව ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවන්හිදී පමණක් නව නිපැයුම හා එහි ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීම උදෙසා ඉදිරිපත් කළ හැකි තරමේ ප්‍රමාණවත් තොරතුරු විනිශ්චය මණ්ඩලය වෙත අයදුම්කරුවන් විසින් සැපයීමට වගබලා ගත යුතු ය.

**මෙම මාර්ගෝපදේශයෙහි ඇතුලත් උපදෙස් පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් කොමිසම විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **"සහසක් නිමැවුම් පළාත් තරඟය 2020"** යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කර **කොමසාරිස්, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, අංක 46-48, කොටා පාර, කොළඹ 08.** යන ලිපිනය වෙත අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට ප්‍රථම යොමු කළ යුතු ය.

**අන්තර්ජාල අයදුම්පත්‍රය (Online Application)** ( "සහසක් නිමැවුම් 2020" සඳහා අයදුම් කිරීමේදී කොමිසමේ වෙබ් අඩවියෙහි (www.slic.gov.lk) දක්වා ඇති අන්තර්ජාල අයදුම්පත්‍රය (http://slic.gov.lk/sn2020/) සම්පූර්ණ කිරීම හරහා තරඟයට ලියාපදිංචි වීමට ඔබට අවස්ථාව හිමි වන අතර, ඔබ විසින් සම්පූර්ණ කර අත්සන් කරන ලද අයදුම්පත **අනිවාර්යයෙන්** කොමිසම වෙත යොමු කළ යුතු ය.

එය අයදුම්කරුවන් සතු වගකීමක් වන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේපවීම පිළිබඳව කොමිසම විසින් වගකියනු නොලැබේ.

අයදුම්පත සම්පූර්ණ කර කොමිසම වෙත භාර දුන් පසු අයදුම්පතෙහි සිදු කරන කිසිදු වෙනස් වීමක් කොමිසම විසින් භාර ගනු නොලැබේ.

- **පළාත් ඇගයීම් සඳහා අයදුම්පත් යොමු කිරීමේ දී කාලසටහනෙහි දක්වා ඇති නියමිත දිනය වන විට අයදුම්පත් යොමු කර තිබීම අනිවාර්ය වන අතර, පළාත් ඇගයීම් පැවැත්වෙන දිනයේ රැගෙන එන නව අයදුම්පත් කිසිදු ලෙසකින් සලකා බලනු නොලැබේ.**
- **අයදුම්පත් යොමු කළ නව නිපැයුම්කරුවන් කාලසටහනෙහි දක්වා ඇති පරිදි නියමිත දිනයේදී අදාල තෝරාගැනීම් සඳහා සහභාගී විය යුතු වන අතර, කොමිසම විසින් නැවත දැනුවත් කිරීමේ ලිපියක් යොමු නොකරන බව සැලකිය යුතු ය.** යම් හෙයකින් අදාල දිනයන් හි සංශෝධනයන් සිදුවන්නේ නම් පමණක් ඒ පිළිබඳව දැනුම් දීමට කටයුතු සලස්වනු ලැබේ.

## බුද්ධිමය දේපළ අයිතිය

තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන නව නිපැයුම් ස්ව නිර්මාණ විය යුතුය. වෙනත් පුද්ගලයෙකු විසින් නිර්මාණය කරන ලද නව නිපැයුමක් ප්‍රති නිර්මාණය කර තරඟයට ඉදිරිපත් නොකළ යුතුය. යම් හෙයකින් එසේ ඉදිරිපත් කර ජයග්‍රහණය කර ඇති අවස්ථාවකදී, එම නව නිපැයුමේ මුල් හිමිකරුගේ බුද්ධිමය දේපළ අයිතිය උල්ලංඝනය වී ඇති බව නිසි සාක්ෂි සහිතව තහවුරු වුවහොත් ප්‍රදානය කරන ලද ත්‍යාග හා සියළුම සහතික ආපසු ලබා ගැනීමට කොමිසම කටයුතු කරන අතර එසේ ආපසු ලබා දීම සඳහා ඔබ ද බැඳී සිටී.

## තරඟ පැවැත්වීම සහ තරඟ විනිශ්චය

කොමිසම මඟින් අනුමත විනිශ්චය මණ්ඩලයේ තීරණය, විනිශ්චය සම්බන්ධයෙන් අවසන් තීරණය වේ.
දැනුවත් කිරීමේ වැඩසටහන් හා නව නිපැයුම් තෝරාගැනීමේ මූලික තරඟ පැවැත්වීමට නියමිත දිනයන් සහ ස්ථාන වෙනස් කිරීම ඇතුළු අනෙකුත් සියලු කරුණු පිළිබඳව තීරණ ගැනීමේ පූර්ණ අයිතිය කොමිසම සතු වේ.

## තරඟය සඳහා ඉදිරිපත් විය හැකි තාක්ෂණික ක්ෂේත්‍ර

ඔබගේ නව නිපැයුම පහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් වඩාත් සුදුසු **එක් ක්ෂේත්‍රයකට** අයත් විය යුතුය.

- මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
- රසායන විද්‍යාව
- ආහාර තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
- සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
- පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
- භෞතික විද්‍යාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- කෘෂිකර්මය
- ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ
- බලශක්තිය
- පරිසර සංරක්ෂණය
- ප්‍රවාහන
- ඉංජිනේරු